ඩබ්ලිව්.එස්.එම්.එස්. ප්‍රනාන්දු	C2212*26	2022-12-30	291	1	1	0	2509		11			2022-12-30	15,000	15,000	-	15,000
M.D. කන්ස්ට්‍රක්ෂන්ස් - බිල්ඩර්ස්	C2212*27	2022-12-30	291	1	1	0	2509		11			2022-12-30	2,673,725	2,673,725	-	2,673,725
වික්‍රම කන්ස්ට්‍රක්ෂන්ස්	C2212*28	2022-12-30	291	1	1	0	2509		11			2022-12-30	207,000	207,000	-	207,000
ඉසුල ඉංජිනියරින් වර්ක්ස්	C2212*29	2022-12-30	291	1	1	0	2509		11			2022-12-30	776,000	776,000	-	776,000
M.D. කන්ස්ට්‍රක්ෂන්ස් - බිල්ඩර්ස්	C2212*30	2022-12-30	291	1	1	0	2509		11			2022-12-30	614,100	614,100	-	614,100
ලක්ෂිකා මෙටල් ක්‍රෂර්	C2212*31	2022-12-30	291	1	1	0	2509		11			2022-12-30	137,340	137,340	-	137,340
පෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් ලිමිටඩ්	C2212*32	2022-12-30	291	1	1	0	1302		11			2022-12-30	39,043	39,043	-	39,043
පෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් ලිමිටඩ්	C2212*33	2022-12-30	291	1	1	0	1302		11			2022-12-30	77,568	77,568	-	77,568
ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී	C2212*34	2022-12-30	291	1	1	0	1402		11			2022-12-30	1,315	1,315	-	1,315
මොබිටෙල් ප්‍රයිවට් ලිමිටඩ්	C2212*35	2022-12-30	291	1	1	0	1402		11			2022-12-30	852	852	-	852
එකතුව													**21,168,077**	**21,168,077**	**29,074**	**21,139,003**
මුළු එකතුව																**21,557,921**

ගෙවීම්/බැඳීම්වල ස්වභාවය පහත සඳහන් ආකාරයට හඳුනාගත යුතු ය.

1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු 2. රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල 3. පෞද්ගලික අංශය

බැරකම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවලට අදාළ වත්කම් හා සේවාවන් ලැබී ඇති නමුත් ගිණුම් වර්ෂය තුළදී ඒ සඳහා අදාළ පාර්ශ්වයන්ට ගෙවීම් සිදුකර නොමැති ගනුදෙනුය.

බැඳීම් යනු අදාළ ගිණුම් වර්ෂය ඇතුළත භාණ්ඩ, සේවාවන් හෝ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් අදාළ වත්කම් හෝ සේවාව ආයතනය වෙත ලැබී නොමැති, එහෙත් එකී භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අරමුණින් බාහිර පාර්ශ්වයන් සමඟ එළඹ ඇති ගිවිසුම් හෝ ලිඛිත එකඟතාවයන්ය.

ප්‍රධාන ගණකාධිකාරී

දිනය :

බැරකම් පිළිබඳ ප්‍රකාශය - (i)

ඇමුණුම - (iv)

මු.රෙ. 94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය

වියදම් ශීර්ෂ අංකය : 291

දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ

වැඩසටහන් අංකය හා නාමය : 01 - මෙහෙයුම් වැඩසටහන

පුද්ගලයාගේ/ආයතනයේ නම	බැඳීම් පිළිබඳ විස්තරය	ව්‍යාපෘතිය	උප ව්‍යාපෘතිය	වැය විෂය සංකේතය	මූල්‍යකරණ සංකේතය	මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව (රු.)	මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.)	බැඳීම් හා බැරකම් වටිනාකම (රු.)
1. අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු ලේකම්, ධීවර අමාත්‍යාංශය	කාර්යාල සනීපාරක්ෂක සහ ආරක්ෂක සේවා	1	0	1409	11			5,704,454
එකතුව								**5,704,454**
මුළු එකතුව								**5,704,454**

ප්‍රධාන ගණකාධිකාරි

දිනය :

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2022.12.31 දිනට තත්ත්ව වාර්තාව

ඇමුණුම - (viii)

වියදම් ශීර්ෂ අංකය : 291

දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2022.12.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය (රු.)	2022.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2022.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
01	ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාව	0007042641	12,785,349	-	-	දෙසැම්බර් 2022
02	ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාව	0007040117		-	-	

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

ප්‍රධාන ගණකාධිකාරි
දිනය :

3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. 000

ආදායම් කේතය	ආදායම් සංග්‍රහයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසාන ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003-02-99	පරිපාලන ගාස්තු සහ ගාස්තු	42,000	42,000	45,800	109.05
2002-02-99	පොලී-වෙනත්	1,600	1,200	1,480	123.33

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		සත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රති	අවසාන		
පුනරාවර්තන	336,660	336,660	322,899	95.91
ප්‍රාග්ධන	191,085	191,085	165,722	86.73

3.8 වෙනත් අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන නොලැබුණි

අදාළ නැත.

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය 31/12/2022	2022/12/31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි සහ වියුහ	-	175,898	-	-
9152	යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන	-	319,687	-	-
9153	ඉඩම්	-	102,688	-	-
9154	අස්පෘෂ්‍ය වත්කම්	-	14,528	-	-

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එන්බඑල්/ඩී/සීසී&සීආර්එම්ඩී/එන්ජේ/01/2022 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තක්ෂාගණනය කළ මතය

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්හි සහනාධාර හා මාරුකිරීම් යටතේ පෙන්විය යුතු රු. 3,111,073 ක් පුද්ගල පඩිනඩි යටතේ දක්වා තිබුණි.

(ආ) 2022 දෙසැම්බර් මාසයේදී රු. 555,000 කට අලෙවි කරන ලද මෝටර් රථ ආයෝජන ක්‍රියාකාරකම් හි මුදල් ගලා ඒමක් ලෙස දක්වනු වෙනුවට වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් වශයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

1.6.2 අග්‍රිම සැසඳුම් ප්‍රකාශය

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව "අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් දරන ලද වියදම්" රු. 10,423,210 ක් වුවද, එය රු. 9,370,493 ක් වශයෙන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශයෙහි දක්වා තිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ රු.42,007,000 කට තක්සේරු කර දක්වා තිබුණු මොරටුව, මාතර සහ ගොඩවාය යන ඉඩම් 03 ක අයිතිය 2022 දෙසැම්බර් 31 දින වන විට ද දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණි.

(ආ) හලාවත ප්‍රාදේශීය කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලැබුව ද, එය රු.2,800,000 කට ඇස්තමේන්තු කර මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) 2014 ජුනි 20 දින කුච්චවේලි ප්‍රාදේශීය ලේකම්වරයා විසින් දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරා දී තිබුණු ත්‍රීකුණාමලය ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන ඉඩම රු. 12,400,000 කටත්, ගොඩනැගිලි රු.44,000,000 කටත් ඇස්තමේන්තු කර තිබුණ ද, ඒවා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) 1999 හා 2017 වර්ෂයන්හි දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර රු.9,800,000 කට තක්සේරු කර තිබුණු මෝටර් රථ දෙකක් සහ එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතනය මඟින් 2022 වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත පවරන ලද යතුරුපැදි දෙකක් ඇතුලුව දෙපාර්තමේන්තුව සතු යතුරු පැදි 08 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ප්‍රසම්පාදන කමිටු තීරණයක් අනුව 2022 හා 2023 වර්ෂයන්හි රු. 2,192,000 කට අලෙවි කරන ලද වාහන 07 ක් වාහන අලෙවිකරණ අවස්ථාව වන විටත් මූල්‍ය නොවන වත්කම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

1.6.4 තැන්පතු ගිණුම් ශේෂ

වෙරළ ආරක්ෂක ත්‍යාග අරමුදලට අධිකරණය මඟින් අයකර එවනු ලබන දඩ මුදල්වලින්, එම අරමුදලේ රඳවාගත යුතු රු.482,015 ක් දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	වාහන ලැයිස්තුගත ලේඛනය	මුදල්රෙගුලාසි 1647 (ඉ)	පවත්වා නොතිබුණි.
(ආ)	අත්කිකාරම් ලේඛනය	මුදල්රෙගුලාසි 371	විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අදායම් කළමනාකරණය

ලංකා මිනරල් සෑන්ඩ් ලිමිටඩ් ආයතනය වෙත 2007 වර්ෂයේ සිට 2020 සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ ලබා දුන් බලපත්‍ර 04 කට හා 2020 සැප්තැම්බර් 07 සිට 2021 සැප්තැම්බර් 06 දක්වා කාලයට නිකුත් කරන ලද බලපත්‍රයට අදාළව එම ආයතනය විසින් අනුමත කළ වැලි කියුබ් ප්‍රමාණය ඉක්මවා වැඩිපුර සිදුකළ කැණීම්වලින් අයවිය යුතු පිළිවෙලින් රු.72,895,000 ක හා රු1,688,515 ක ගාස්තුව අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කර ඇති බවට ගණන් දීමේ නිලධාරියා වගබලා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූ. රෙ. 66 සහ මූ. රෙ. 69 මාරු කිරීම් මඟින් වැය විෂයයන් 07 ක අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සියයට 23 ක සිට සියයට 300 ක් දක්වා වූ පරාසයකින් වෙනස් කර තිබුණු බවට නිරීක්ෂණය විය.

2.3 **බැරකම් හා බැදීම්වලට එළඹීම**

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,704,453 ක් වන බැරකම් තුළ 2019 වර්ෂය වෙනුවෙන් ධීවර අමාත්‍යාංශයට ගෙවිය යුතු රු.2,875,316 ක ආරක්ෂක සේවා මුදලක් හා රු. 455,237 ක සේවා වියදමක් පවතින බවට නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනයේ සටහන (iii) හා (iv) ප්‍රකාශනයේ 2022 දෙසැම්බර් 31 දිනට පැවති සියළුම බැරකම් අනාවරණය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළ රු. 266,233 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන තුළින් අනාවරණය කර නොතිබුණි.

2.4 **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ)	2011 අංක 49 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ සංශෝධිත පනතේ 31(4) වගන්තිය	2015 සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වැයකර තිබුණු රු.3,410,551 කින් රු.2,892,165 ක් අදාළ පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණු අතර එම අගය වැය කළ මුදලින් සියයට 84.8 ක් විය.

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ මූදල් රෙගුලාසි 880	ඇප ආඥා පනතට අනුව අදාළ නිළධාරීන්ගෙන් ඇප මූදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවක්ම මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කි.මී. 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කළ යුතු වුවද, ආයතනයේ වාහන 17 ක් සම්බන්ධයෙන් එලෙස ඉන්ධන පරීක්ෂා කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ නිම කිරීමට සැලසුම්කර තිබූ ඉදිකිරීම් කාර්යයන් 04 කට අදාළ භෞතික ප්‍රගතිය සියයට 5 ත් සියයට 35 ත් අතර පරාසයක ප්‍රමාණයක් වීම හේතුවෙන් එම ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) 2012 සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කළ අනවසර ඉදිකිරීම් 2,228 කින් අනවසර ඉදිකිරීම් 2,069 ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2021 හා 2022 වර්ෂයන්හි දිස්ත්‍රික්ක 13 ක ක්‍රියාමාර්ග ගැනීමට තිබූ බවට හඳුනාගත් මුලු අනවසර ඉදිකිරීම් 861 කින් අනවසර ඉදිකිරීම් 255 ක් සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2018 ඔක්තෝබර් 23 දිනැති අංක පීඑෆ්ඩී 05/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් e-GP පද්ධතිය හරහා විද්‍යුත් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා එහි සඳහන් ආකෘතීන් ප්‍රකාරව ප්‍රසම්පාදන සම්බන්ධීකරණ නිලධාරියෙකු පත්කර එම තොරතුරු ද සමඟ ආයතනය විසින් 2015 වර්ෂයේ සිට සිදු කළ ප්‍රසම්පාදන කාර්යයන් පිළිබඳ විස්තර හා 2019 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර 2018 නොවැම්බර් මාසයේදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් ඊට අදාළව කිසිදු කාර්යයක් මේ දක්වා සිදුකර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

(අ) විදුලිය පද්ධතියේ පවතින දෝෂයක් හේතුවෙන් 2022 මාර්තු සිට වසරකට අධික කාලයක් ධාවනය නොකර එකතැන නවතා ඇති වාහනයක් අලුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් ද, වටිනාකම රු. මිලියන 11.9 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ Volvo Excavator රථයක් වසර ගණනාවක් තිස්සේ භාවිතයට නොගැනීම හේතුවෙන් ද අඛලන් තත්ත්වයට පත්ව දිරායෑමට ලක්වන බවට නිරීක්ෂණය විය.

(ආ) වටිනාකම රු. 5,800,000 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අංක PD-1046 දරන TOYOTA HILUX ඩබල් කැබ් රථය 2021 නොවැම්බර් 16 වන දින වෙරළ සංරක්ෂණ හා පහන්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණ ද, එහි අයිතිය පැවරීමට හෝ එම වාහනය දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 පාඩු හා හානි

2022 ජූනි 23 වන දින Hyundai Excavator යන්ත්‍රයට සිදු වී ඇති රු.54,320 ක අලාභය සම්බන්ධ පරීක්ෂණ කටයුතු නිමකර පොතෙන් කපාහැරීමට හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **තිරසාර සංවර්ධනය**

4.1 **තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය**

දේශගුණික ආශ්‍රිත වෙරළබඩ ආපදා වැළැක්වීම හා වෙරළබඩ පරිසර පද්ධති තිරසාර ලෙස සංරක්ෂණය කිරීම යන තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ හඳුනාගත් කෘතීම වැලි පෝෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **මානව සම්පත් කළමනාකරණය**

5.1 **අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 541 ක් වූ අනුමත කාර්ය මණ්ඩලයෙන් තත්‍ය කාර්යමණ්ඩලය 417 ක් වූයෙන් තනතුරු 124 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක් ද, තෘතීය හා ද්විතික මට්ටම්වල තනතුරු 43 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 66 ක් ද විය. තවද, අනුමත සංවර්ධන නිලධාරී තනතුරු 90 ක් වුවද, තත්‍ය සංඛ්‍යාව 114 ක් වූයෙන් 24 ක අතිරික්තක් ද විය. ඒ අනුව තත්‍ය වශයෙන් පවතින තනතුරු සංඛ්‍යාව මත රාජකාරි කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචනය කර අවශ්‍යතාවය අනුව සංශෝධනයන් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආර්.එම්.එම්.එස්. පෙරේරා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

ආර්.එම්.එම්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය		
	100% -90%	75% - 89%	50% -74%
ඵලදායී ආරක්ෂිත වෙරළ දිග		76%	
ඵලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ තීරයේ දිග			0%
පිරිසිදු කරන ලද වෙරළ දිග	100%		
සංරක්ෂණය කරන ලද සංවේදී කලාප වර්ග ප්‍රමාණය			0%
ප්‍රතිශ්ඨාපනය කරන ලද කඩොලාන ප්‍රමාණය		75%	
වෙරළබඩ ජල තත්වය PH 8 වඩා වැඩි මට්ටමක තිබේදැයි පරීක්ෂා කිරීම	100%		0%
සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාණය		82%	
දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය	100%		

05 වන පරිච්ඡේදය

ඉටුකරගත හැකි තිරසාර සංවර්ධන ඉලක්කවල (SDG) කාර්ය සාධනය

5.1 හඳුනාගත් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG)

ආයතනික අරමුණ අනුව ඉලක්ක	ක්‍රියාමාර්ග	ජයග්‍රහණය පිළිබඳ දර්ශක	2022 ඉලක්ක	2022 ප්‍රගතිය	% 0 - 49	% 50 - 74	% 75 - 100	SDG රාමුව තුළ ලබා දී ඇති අදාළ ප්‍රතිපත්ති ඉලක්කය
13. ඉලක්ක : දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට විරෙහිව සටන් කිරීමට ඉක්මන් පියවර ගන්න								
1. දේශගුණය ආශ්‍රිත වෙරළබඩ ආපදා හේතුවෙන් අහිතකර බලපෑම් වැලැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු කිරීම	1.1. වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම.	a. ඵලදායී ආරක්ෂිත වෙරළ දිග	4500m	3430m			76	13.1. සෑම රටකම දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත්වලට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කිරීම.
	1.2. කෘතිම වැලි පෝෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	b. ස්ථාවර කරන ලද ඵලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ දිග	0	0	0			
	1.3. කඩොලාන තීර ප්‍රතිශ්ඨාපනය කිරීම	c. වගා කරන ලද ප්‍රමාණය	1000m2	750m2			75	
14. ඉලක්ක : තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසාර ලෙස භාවිතා කිරීම								
2. සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ අඩු කිරීම සහ විවිධ ස්ථානවල වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් (චය) මැනීම සහ දත්ත හුවමාරු කිරීම	2.1. වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	d. පිරිසිදු කරන ලද සමුච්චිත වෙරළ දිග	2000m	4000m			100	14.1. 2025 වන විට, සමුද්‍ර සුන්බුන් සහ පෝෂක දූෂණය ඇතුළුව, විශේෂයෙන්ම ගොඩබිම පදනම් වූ ක්‍රියාකාරකම් වලින්, සියලු වර්ගවල සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු

ආයතනික අරමුණ අනුව ඉලක්ක	ක්‍රියාමාර්ග	ජයග්‍රහණය පිළිබඳ දර්ශක	2022 ඉලක්ක	2022 ප්‍රගතිය	% 0 - 49	% 50 - 74	% 75 - 100	SDG රාමුව තුළ ලබා දී ඇති අදාළ ප්‍රතිපත්ති ඉලක්කය
	2.2. වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් මැනීම.	e. 2026 දක්වා සාමාන්‍ය වාර්ෂික වෙරළබඩ ජලයේ pH මට්ටම 8.0 ට වැඩියෙන් පවතීදැයි පරීක්ෂා කිරීම.	ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම.	ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම සිදු කර ඇත.			100	14.3 සෑම තරාතිරමකම වැඩිදියුණු කරන ලද විද්‍යාත්මක සහයෝගීතාවය ඇතුළුව සාගර ආම්ලිකතාවයේ බලපෑම් අවම කිරීම සහ ඒවාට විසඳුම් සෙවීම.
3. සෞඛ්‍ය සම්පන්න සහ ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා ඒවා ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව සැලකිය යුතු අහිතකර මානව බලපෑම් වළක්වා ගැනීම සඳහා සාගර සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසාර ලෙස සංරක්ෂණය කිරීම, කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම.	3.1. බලපෑමට ලක් වූ ප්‍රදේශ හඳුනා ගෙන කලමනාකරණය කිරීම	f. වැලි කඳු, කඩොලාන සහ ලවණ වගුරු හා සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය කරන ලද ප්‍රමාණය	හෙක්ටයාර් 150	0	0			14.5 2020 වන විට, ජාතික හා ජාත්‍යන්තර නීතියට අනුකූලව සහ පවතින හොඳම විද්‍යාත්මක තොරතුරු මත පදනම්ව වෙරළබඩ සහ සමුද්‍ර ප්‍රදේශවලින් අවම වශයෙන් සියයට 10 ක් සංරක්ෂණය කරන්න.

5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග කෙටියෙන් විස්තර කරන්න

හඳුනා ගත් තිරසාර සංවර්ධන ඉලක්ක කරා හැකි උපරිමයෙන් ළඟා වීමට උත්සාහ කරන අතර ඉන් සමහරක් ඉලක්ක පාර්ශවකාර ආයතන සමඟ එකමුතුව ඉටු කර ගත යුතු ව ඇත.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක කළමනාකරණය

	අනුමත සේවක	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	43	28	15
තෘතික	4	0	4
ද්විතික	322	284	38
ප්‍රාථමික	172	109	63

06.2 ** ආයතනයේ ක්‍රියාකාරීත්වයට මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය කෙටියෙන් සඳහන් කරන්න

01) සේවක ඌනතාවයක් පවතින විට ආයතනයේ කාර්යසාධනය සෘණාත්මක වීම සිදුවේ. 02) කාර්යන්වල කාර්යක්ෂමතාවය අඩුවීම මත වීම ප්‍රතිපලය ලැබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණුව ලත් කාර්ය මණ්ඩලය	වැඩසටහනේ කාලසීමාව	මුළු ආයෝජනය (රු. 1000)		වැඩසටහනේ ස්වභාවය (විදේශ / දේශීය)	දැනුම ලබා ගැනීම *
			දේශීය	විදේශීය		
ද්විතීයික නිළධාරීන් සඳහා වන දෙමළ පුහුණු පාඨමාලාව	30	පැය 150	115.3		දේශීය	දෙමළ භාෂාව
කණිෂ්ඨ නිළධාරීන් සඳහා වන දෙමළ පුහුණු පාඨමාලාව	28	පැය 100	75.00		දේශීය	දෙමළ භාෂාව

* ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

- ආයතනයේ විවිධ විෂයන් පිළිබඳ දැනුම යාවත්කාලීන වීම තුලින් ඵලදායිතාව ඉහල නැංවීමට හැකි වීම.
- පුහුණු වැඩසටහන් තුලින් ආකල්ප හා පුද්ගල සංවර්ධනය, සාමූහික වගකීම් වැඩි දියුණු වීම.
- සේවකයින්ගේ සේවා අවශ්‍යතා හදුනා ගැනීම තුලින් ඔවුන් ඵලදායී මට්ටමට ලගා වීමට අවශ්‍ය පහසුකම් සැපයීම කඩිකම් වීම
- පුහුණුව තුලින් ලබා ගන්නා දැනුම නව ක්‍රමවේද හා කාර්යක්ෂම කාර්යාල ක්‍රම තුලින් සේවක අභිප්‍රේරණය ඇති කිරීමට හැකි වීම.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශය	අනුකූල		
1.2	රාජ්‍ය අත්තිකාරම් ගිණුම	අනුකූල		
1.3	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත් සහ ලේඛණ නඩත්තු කිරීම (FR445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ (267/2018) අනුව ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තු කර යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.2	පුද්ගලික දීමනා ලේඛනය / පුද්ගලික දීමනා කාඩ්පත් නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.	අනුකූල		
2.3	විගණන විමසුම් ලේඛනය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.	අනුකූල		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලියාපදිංචි කර නඩත්තු කර යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශනියමිත දිනට භාණ්ඩාගාරයට (CIGAS) සකස් කර ඉදිරිපත් කරනු ලැබේ.	අනුකූල		
2.6	චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය පවත්වා ගෙන යාම යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.7	භාණ්ඩ වට්ටෝරු ලේඛනය යාවත්කාලීන කර යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.8	තොග ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.9	පාඩු ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත.	අනුකූල		
2.10	බැඳීම් ලේඛනය නඩත්තු කිරීම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍යය ආයතනය තුළ පවරා ගැනීම.	අනුකූල		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරීම.	අනුකූල		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම.	අනුකූල		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම.	අනුකූල		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම.	අනුකූල		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිලිතුරු ලබා දී තිබීම.	අනුකූල නොවේ	සෑම අංශයකින්ම තොරතුරු රැස් කිරීමට කාලයක් ගත වන නිසා	නිවැරදි කිරීමට උපදෙස් දෙනු ලැබ ඇත.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රේ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම.	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිලිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	සෑම ප්‍රාදේශීය කාර්යාලයක් මගින් තොරතුරු රැස්කිරීමෙදී දිගු කාලයක් ගතවේ.	නිවැරදි කිරීමට උපදෙස් දෙනු ලැබ ඇත.
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල		
7	**විගණන කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	අනුකූල		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම.	අනුකූල		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල නොවේ	රටේ පැවති අයහපත් ආර්ථික තත්වය තුළ සිදු කල නොහැකි විය.	2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර ඇති අතර 2023 වර්ෂයේ නියමිත දිනට සිදු කිරීමට කටයුතු කර ඇත. 2023 වර්ෂයේ දී අපහරණය කිරීමට සැලසුම් කර ඇත.
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම.	අනුකූල නොවේ	2022 වර්ෂයේ වාහන 06ක් අපහරණය කළ අතර ඉතිරි යතුරුපැදි 02ක් හා යන්ත්‍ර 03ක් ඉතිරි වී ඇත.	2023 වර්ෂයේ අපහරණය කිරීමට කටයුතු කරමින් පවතී.
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ	2022 ගර්හිත වාහන 06ක් අපහරණය කළ අතර තවදුරටත් යන්ත්‍ර 03ක් හා යතුරුපැදි 02ක් අපහරණය කිරීමට ඉතිරිව ඇත.	බැහැර කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී.
9.3	වාහන ලොග් පොත පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල		
9.4	සෑම වාහන අනතුරක්ම සම්බන්ධයෙන් මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	ඉන්දන අර්බුදය හේතුවෙන් සිදු කළ නොහැකි විය.	2023 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.
9.6	කල්බදු කාල සමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
10	**බැකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට ඒම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම.	අනුකූල		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල		
11.2	මු.රේ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදනසීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම.	අනුකූල		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම.	අනුකූල		
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ.රේ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	ප්‍රමාද වී ඇත	නිවැරදි කිරීමට උපදෙස් ලබා දී ඇත
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල		
15	**අදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ අදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම.	අදාළ නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව තිබීම.	අනුකූල		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යෑම.	අනුකූල		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු වීහි වේබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල		

අංකය	අයදුම් කිරීමේ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ)	අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක්	අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පණතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා කර තිබීම	අනුකූල		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල		
19	**මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම.	අනුකූල		
19.2	කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩල සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්ම පිළියෙළ කිරීම.ධාරිතා සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පත් කොට තිබීම.	අනුකූල		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඳින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල		